# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2000 අංක 18 දරන හබරකඩ සිරි ධර්මවිජය සහන සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2000 මැයි මස 31 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 ජූනි මස 02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදි.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 5.75 යි. තැපැල් ගාස්තුව : රු. 3.50 යි.

## 2000 අංක 18 දරන හබරකඩ සිරි ධර්මවිජය සහ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2000 මැයි මස 31 වන දින.]

එල්. ඩී.—ඕ. 47 /97.

### හබරකඩ සිරි ධර්මවිජය සහන සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"හබරකඩ සිරි ධර්මවිජය සහන සේවා පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයින් එකඟ වී ඇති රීතිවලට අනුකූලව එකී පදනම සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් හෝමාගම, හබරකඩ ධර්මවිජයාශ්‍රමයේ අංක 278/4 දරන ස්ථානයේ පිහිටුවා තිබූ හෙයින් ද : — පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් සහ ඒ පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලුම්කර ඇති හෙයින් සහ එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2000 අංක 18 දරන හබරකඩ සිරි ධර්මවිජය සහන සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු 'පදනම' යනුවෙන් සඳහන් කරනු ලබන හබරකඩ සිරි ධර්මවිජය සහන සේවා පදනමේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු 'සංස්ථාව' යනුවෙන් සඳහන් කරනු ලබන) හබරකඩ සිරි ධර්මවිජය සහන සේවා පදනමට මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉත් පසුව "හබරකඩ සිරි ධර්මවිජය සහන සේවා පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය එයට ඇත්තේ ය. තව ද එකී සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. — හබරකඩ සිරි ධර්මවිජය සහන සේවා පදනම සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :-

(අ) ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා අධ්‍යාපන ආයතන සහ නේවාසිකාගාර පිහිටුවා නඩත්තු කිරීම ;

(ආ) දුප්පත් ශිෂ්‍යයනට මූල්‍ය ආධාර දීම සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම ;

(ඇ) දුප්පත්, අනාථ සහ රෝගී තැනැත්තන්ට වෛද්‍ය ආධාර, ආහාර, ඇඳුම් පැළඳුම් සහ නිවාස ලබාදීම ;

(ඈ) අඳ, ගොළු, බිහිරි තැනැත්තන් සඳහා සුභසාධන පහසුකම් සැලසීම ;

(ඉ) සිංහල, පාලි, සංස්කෘත, බුද්ධාගම, ආයුර්වේදය සහ විද්‍යාව අධ්‍යයනය කිරීම සඳහා පාඨමාලා පැවැත්වීමෙන් ගිහි පැවිදි දෙපක්ෂයේම අධ්‍යාපනය නංවාලීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(ඊ) පූජ්‍ය වල්ලබගල ශ්‍රී ප්‍රඥාසාර මාහිමි ගුණානුස්මරණ වාර්ෂික පුණ්‍යෝත්සවය සහ සංස්ථාව මගින් අනුමත කරන ලද සියලුම ආගමික උත්සව පැවැත්වීම ; සහ

(උ) ඉහත සඳහන් පරමාර්ථ සියල්ල හෝ ඉන් කිසිවක් ඉටු කර ගැනීම සඳහා ආනුෂංගික හෝ හිතකර වන වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද, කොන්ත්‍රාත් සහ ගිවිසුම්වලට ඇතුළත්වීමේ ද ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ යෙදවීමේ, සංයුක්ත කිරීමේ සහ සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් කිසිවක් සාක්ෂාත් කර ගැනීම සඳහා සහ අභිවර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය කවර හෝ ක්‍රියා, කරුණු හෝ දේ කිරීමේ ද ඉටු කිරීමේ ද ක්‍රියාවේ යෙදවීමේ ද බලය සංස්ථාවට ඇත්තේ ය.

5. (1) සංස්ථාවේ කටයුතු තත්කාලයේ බලපවත්නා සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කරගනු ලබන කළමනාකරණ මණ්ඩලයක් මගින් ඒ රීතිවලට යටත්ව පරිපාලනය කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දැරූ පදනමේ කළමනාකරණ මණ්ඩලය විය යුතු ය.

6. (1) පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාවේ යම් මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්ද සංඛ්‍යාවකින් කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් වර්ග කිරීම, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ නෙරපීම ;

(ආ) නිලධරයන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ධුරය හිස් කිරීම, ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ චර්යාව ;

(ඇ) කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ චර්යාව හා ඔවුන්ගේ ධුර කාලය ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම, එහි දී අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම් පවත්වනු ලබන වේලාවන්, ස්ථාන, ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම, ගණපූරණය, න්‍යාය පත්‍රය සහ රැස්වීම්වල කටයුතු කරගෙන යාම ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කලමනාකරණය කිරීම, සංස්ථාවේ මුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වා ගෙන යාම සහ ඒවා විගණනය කිරීම ;

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ රීති, (1) වන උපවගන්තිය යටතේ රීතියක් සෑදූ ආකාරයෙන් එවැනි රැස්වීමක දී එවැනිම ආකාරයෙන් වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව මංචු දිනයේ දී බලාත්මකව පැවති පදනමේ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට, මේ වගන්තිය යටතේ සංස්ථාවේ රීති ලෙස සැලකිය යුතු ය.

(4) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

7. (1) සංස්ථාවට සංස්ථාවෙහි ම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පැවරීම්, දායක මුදල් හෝ ගාස්තු වශයෙන් ලැබෙන සියලු මුදල් සංස්ථාවේ නමින් සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක තැන්පත් කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය කිරීම, වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා යම් ක්ෂය අරමුදලක්, සංචිතයක් හෝ නිදන් අරමුදලක් කළමනාකරණ මණ්ඩලය විසින් ඇති කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ සංස්ථාවේ බලතල කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන සියළු වියදම් ඒ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

විගණනය සහ ගිණුම්.

8. (අ) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(ආ) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නියි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(ඇ) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරි සමාගමක්,

අදහස් වේ.

9. (1) සංස්ථාව ලාභ නොලබන සංවිධානයක් විය යුතු අතර, සංස්ථාවේ ලාභ හෝ ලාභාංශ කිසිවක් වේ නම්, ඉන් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු ය.

සංස්ථාව ලාභ නොලබන සංවිධානයක් විය යුතු බව.

(2) සංස්ථාව විසුරුවා හරිනු ලබන විටෙක, සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවනු ලැබීමෙන් පසුව ඉතිරිවන සියලු වත්කම් හුදෙක් පුණ්‍ය කාර්ය හෝ අධ්‍යාපනික කාර්ය සඳහාම පිහිටුවනු ලැබ ඇති, එහි රීති මගින් එහි වත්කම් එම සාමාජිකයන් අතර බෙදා ගැනීම තහනම් කර ඇති යම් අරමුදලකට හෝ සංවිධානයකට පමණක් පවරා දෙනු ලැබිය යුතු ය.

10. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී පදනම විසින් ගෙවිය යුතුව තිබූ සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතුව තිබුණු සියලුම ණය සහ දායක මුදල් හා පරිත්‍යාග මෙම පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

11. මිල දී ගැනීමකින්, ප්‍රදානයකින්, පරිත්‍යාගයකින්, තෙස්තමේන්තු නියාදනයකින් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතුවන කවර හෝ චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට, දැරීමට සංස්ථාවට නීතියෙන් බලය තිබෙන අතර, ඒ සියලු

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

දේපළ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව ඒවා විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් යම් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව මෙම පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**12.** සංස්ථාවේ මුද්‍රාව, සභාපති, ලේකම් හෝ භාණ්ඩාගාරික ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාදන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එසේ කරනු ලැබූ අත්සනක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හෝ හිමිකම් පාන්නන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ අන්කිසි රාජ්‍ය සංස්ථාගත ආයතනයක හෝ වෙනත් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් හෝ ඇති නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.